// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 2167/7 - 2020 මාර්තු මස 17 වැනි අඟහරුවාදා - 2020.03.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1971 අංක 29 දරන නිවාඩු පනතේ

10 (1) (අ) වගන්තිය යටතේ නියමය

1971 අංක 29 දරන නිවාඩු පනතේ 10 (1) (අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය, ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, කොරෝනා වෛරසය හේතුවෙන් රට තුළ ක්‍රියාත්මක වන නිරෝධායන කටයුතු සඳහා සහය පිණිස 2020 මාර්තු මස 17, 18, 19 යන අඟහරුවාද, බදාදා, බ්‍රහස්පතින්දා දිනයන් රජයේ විශේෂ නිවාඩු දිනයන් විය යුතු යැයි මෙම නියමය මගින් ප්‍රකාශ කරමි. තවදුරටත් අත්‍යවශ්‍ය වන්නේ නම් පමණක් මෙම නිවාඩුව දීර්ඝ කිරීමට කටයුතු කරන බව ප්‍රකාශ කරමි.

**ජනක බණ්ඩාර තෙන්නකෝන්,**
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.

2020 මාර්තු මස 17 වැනි දින,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1A - G 31985 — 22 (2020/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*